රුහුණ විශ්වවිද්‍යාලය

2015/2016 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 4000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

**SLS 4205 - සිංහල සංස්කෘතිය**

ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩුවිය හැකි ය.)

කාලය : පැය 03

---

01.

i. සංස්කෘතිය යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න.

ii. සංස්කෘතියක් තවත් සංස්කෘතියකින් වෙනස් වන්නේ කවර හේතු සාදක පදනම් කරගෙන දැයි නිදසුන් ඇසුරෙන් පහදන්න.

02. "ප්‍රාග් බෞද්ධ යුගයේ ලක් වැසියා තුළ පැවති විවිධ ආගමික විශ්වාස අතර යක්ෂ හා දේව වන්දනයට මුල් තැනක් හිමි විය." නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.

03. "හින්දු සමයෙහි එන ඇතැම් සංකල්ප සිංහල සංස්කෘතිය තුළ ද නිරූපණය වෙයි." මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

04. "අතීත සිංහල සමාජය, විවිධ අණපනත් හා සිරිත් විරිත් මඟින් වැව හා බැඳී තිබිණි." නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.

05. සාමූහිකත්වය පිළිබඳ සංකල්පය, කෘෂි කර්මාන්තය හා ධීවර ජන ජීවිතය ඇසුරෙහි නිරූපණය වන්නේ කෙසේ දැයි සංසන්දනාත්මක ව පරීක්ෂා කරන්න.

06. ලංකාවේ පැරණි අධ්‍යාපන ක්‍රමයේ ස්වභාවය සහ එහි විකාශනය සිදු වූ ආකාරය සැකවින් පහදන්න.

07. වර්තමාන ජන සමාජයෙහි 'කුල සංකල්පය' කිනම් ව්‍යුහයන් ඔස්සේ ක්‍රියාත්මක වන්නේ දැයි සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 16 බැගිනි.)

@@@@@@@@@

266